*Journal of Social Statistics* *Page 27 - 40*
*JSS (2022) Vol (9) Issue (2)*

# සමාජ මාධ්‍ය හරහා අපරාධ වින්දිතයන් බවට පත්වීමට බලපාන හේතු අධ්‍යයනයඃ බස්නාහිර පළාත ඇසුරින්

කේ. දිනිති ප්‍රදීපා මධුෂානි[1]

***සංක්ෂේපය***

*අන්තර්ජාල තාක්ෂණය සොයා ගැනීමත් සමඟ මානව සන්නිවේදනය වේගවත් වූ අතර වර්තමානය වනවිට ලෝකයේ මෙන්ම ලංකාවේ ද සමාජ මාධ්‍ය හරහා අනවසරයෙන් ඇතුළු වීම, මාර්ගත තර්ජනය, ලුහුබැඳීම, වෛරස්වලට ගොදුරුවීම, වාණිජ පැතිකඩයන් හරහා මුදල් වංචා සිදුකිරීම හා ව්‍යාජ සබැඳි මිත්‍රත්වය වැනි අපරාධයන් රැසක් නිර්මාණය වී ඇත. තවද බස්නාහිර පළාත තුළින් 2019 වර්ෂයේ දී වැඩිම පුද්ගලයන් සංඛ්‍යාවක් වූ 368 දෙනෙකු සමාජ මාධ්‍ය අපරාධ ගොදුරු බවට පත්වී ඇති බව වාර්තා කර ඇත. එමනිසා මෙම අධ්‍යයන සංගහනය ලෙස බස්නාහිර පළාතේ අපරාධ ගොදුරු බවට පත්වූ පරිශීලකයන් 100 දෙනෙකු ස්තෘත සසම්භාවී නියැදුම් ක්‍රමය මඟින් තෝරා ගන්නා ලද අතර අදාළ දත්ත රැස් කිරීම ප්‍රශ්නාවලි ක්‍රමවේදය යටතේ සිදු කරන ලදී. ඒ අනුව මෙම අධ්‍යයන විශ්ලේෂණය තුළින් පුරුෂ 51%ක් සමාජ මාධ්‍ය අපරාධවලට ගොදුරු වී ඇති බවත් එම පරිශීලකයන් අතරින් 50%ක්ම වයස අවුරුදු 25 - 30ත් වයස් කාණ්ඩයේ පසුවන බවත් හඳුනාගත හැකිය. තවද මෙම පරිශීලකයන් අතරින් 69%ක් අවිවාහක වූ අතර 32%ක් උපාධි අපේක්ෂකයන් ලෙස අනාවරණය විය. එසේම 35%ක ප්‍රමාණයක් පෞද්ගලික අංශයේ රැකියාවල නිරත විය. මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වූ සමාජ මාධ්‍ය පරිශීලකයන් අපරාධ ගොදුරු බවට පත්වීමට බලපාන සාධක විශ්ලේෂණයේදී " සාධක බලපෑම", "ආර්ථික බලපෑම" සහ "පරිශීලක හැසිරීමේ බලපෑම" ලෙස ප්‍රධාන සාධක තුනක් යටතේ තෝරාගත් විචල්‍යයන් හඳුනාගත හැකිය. තවද සෙසු අරමුණක් වූ අපරාධ ගොදුරු බවට පත්වීමට බලපාන විචල්‍යයන් සහ ප්‍රජා විද්‍යාත්මක සාධක අතර සම්බන්ධතාව සලකා බැලීමේ දී වයස සමඟ දැනුවත්භාවය නම් විචල්‍යය පමණක් සම්බන්ධතාවක් දක්වන බව පැහැදිලි වේ. තවද මෙම සම්බන්ධතා සලකා බැලීමේ දී සමාජ මාධ්‍ය අපරාධ ගොදුරු බවට පත්වීමට බලපාන විචල්‍යයන් සහ පුමිතිරිභාවය පිළිබඳ සිදුකළ පරීක්ෂාවේ ප්‍රතිඵලවලට අනුව ශක්තිමත් මුරපදයක් භාවිත නොකිරීම, ව්‍යාජ දැන්වීම්වලට ප්‍රතිචාර දැක්වීම, ලින්ක් විවෘත කිරීම යන විචල්‍යයන් තුන සඳහාම 91.5%ක ඉහළ පුරුෂ එකඟතාවයක් දක්වා ඇත. මෙම අධ්‍යයනයේ තවත් එක් සෙසු අරමුණක් වූ පූර්ව සහ පශ්චාත් පරිශීලක හැසිරීම් වන සමාජ මාධ්‍ය භාවිතය, සමාජ මාධ්‍ය තුළ සිටින මිතුරන් සංඛ්‍යාව සහ සමාජ මාධ්‍ය වෙත ඡායාරූප උඩුගත කිරීම යන විචල්‍යයන් අතර වෙනසක් පවතින බව ද නිගමනය විය.*

[1] සමාජ සංඛ්‍යාන අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය.
dinithipradeepa97@gmail.com

*මුඛ්‍ය පදඃ අන්තර්ජාලය, අපරාධ ගොදුරු, සමාජ මාධ්‍ය පරිශීලකයන්, සාධක විශ්ලේෂණය, පරිශීලක හැසිරීම*

## 1. හැඳින්වීම

ලෝකය පුරා ජීවත්වන පුද්ගලයින්ගේ සන්නිවේදනය පරිවර්තනය කළ සිද්ධියක් ලෙස සමාජ මාධ්‍ය හඳුන්වයි (Dewing, 2012). සමාජ මාධ්‍ය යන යෙදුමෙන් අදහස් වන්නේ පරිශීලකයන්ට අන්තර්ජාල හුවමාරුවලට සහභාගී වීමට ඉඩ සලසන පුළුල් පරාසයක් පදනම් කරගත් සේවයකි (ඉරංග, 2016). මිලියන සිය ගණනකට අධික පුද්ගලයින් පෙර නොවූ විරූ වේගයකින් අදහස් හුවමාරු කරගැනීමට, සන්නිවේදනය කිරීමට, සම්බන්ධතා ගොඩනගා ගැනීමට, අන්තර් ක්‍රියා කිරීමට සහ පරිශීලකයින් සකස් කළ දත්ත නිර්මාණය කිරීමටත් සමාජ මාධ්‍ය තුළ බොහෝ කාලයක් වැය කරමින් සිටී (Dewing, 2012).

අන්තර්ජාලය පාදක කරගත් සමාජ මාධ්‍ය ජාලා රැසක් ලෝකය පුරා ජනතාව අතර ජනප්‍රිය වී ඇත්තේ නව මාධ්‍ය වේගයෙන් පැතිරීමේ ප්‍රතිඵලයක් ලෙසිනි. පාසල් වයසේ පසුවන දරුවන්ගේ සිට වැඩිහිටියන් දක්වා සමාජ මාධ්‍යවලට ඇති නැඹුරුතාවය ඉහළය. නව මාධ්‍යයන් තරුණ ප්‍රජාව සමඟ ගත කිරීමේ කාර්යයට උරදී කටයුතු කරයි. එම මාධ්‍යයන් භාවිත කරන තරුණ පිරිස්වල ප්‍රතිශතය සලකා බැලීමේදී මෙය පැහැදිලිවේ (Fansher & Randa, 2018). පසුගිය දශකය තුළ සහ 2005 දී ෆේස්බුක් හඳුන්වාදුන් දින සිට ෆේස්බුක් සමාජ ජාලා වෙබ් අඩවි වේගයෙන් වර්ධනය වීම සහ භාවිතයේ පහසුව මත 2016 වනවිට පරිශීලකයන් ගණන තරුණ වැඩිහිටියන් ගෙන් 90%ක් පමණ වන අතර වයස අවුරුදු 18-29 අතර අයගෙන් අඩක් පමණ ක්‍රියාකාරී ෆේස්බුක් ගිණුම් තිබුණි (Fansher & Randa, 2018).

2020 ජනවාරි වනවිට ලොව පුරා අන්තර්ජාලය භාවිත කරන අයගේ ප්‍රමාණය බිලියන 4.3 ක් ඉක්ම වූ අතර එහි ප්‍රතිශතය ලෝක ජන ජනගහනයෙන් 57% කි. සෑම දිනකම සාමාන්‍යයෙන් මිලියනයකටත් වඩා වැඩි ප්‍රමාණයක් අලුතින් අන්තර්ජාලය භාවිත කරන්නන් අතරට එක් වෙයි. 2021 වර්ෂයේ වනවිට ලෝකයේ අන්තර්ජාල භාවිතය, සමාජ මාධ්‍ය භාවිතය සහ ජංගම දුරකථන සම්බන්ධතා පිළිවෙළින් බිලියන 4.88 ක්, බිලියන 4.55 ක් සහ බිලියන 5.29 ක් ලෙස දක්වා ඇත. එනම් මෙම පරිශීලක සංඛ්‍යාව 2020 වර්ෂයට සාපේක්ෂව ඉහළ යාමක් සිදුවී ඇති බවද පෙන්වා දී ඇත (Kemp, 2021).

2020 ජනවාරි වනවිට ශ්‍රී ලංකාවේ සමස්ත ජනගහනය මිලියන 20.98 කි. අන්තර්ජාලය භාවිත කරන්නන්ගේ ප්‍රමාණය මිලියන 7.1 ඉක්මවයි. එය මුළු ජනගහනයෙන් ප්‍රතිශතයක් වශයෙන් 34% කි. අන්තර්ජාලය භාවිත කරන්නන් අතරින් සක්‍රීය සමාජ මාධ්‍ය පරිශීලකයන්ගේ ප්‍රමාණය මිලියන 6.2 කි. එහි ප්‍රතිශතය 80% කි (Kemp, 2020). ශ්‍රී ලංකාවේ වයස අවුරුදු 16ත් 30ත් අතර පසුවන අයගේ සමාජ මාධ්‍ය පරිශීලනය සම්බන්ධයෙන් වැදගත් කරුණක් අනාවරණය කරගෙන ඇත. මෙම වයස් කාණ්ඩයේ පසු වන්නන්ගෙන් 50% ක් දිනකට පැය 1 සිට 5 දක්වා කාල පරාසයක් සමාජ මාධ්‍ය තුළ කල් ගෙවන අතර, 10%ක් පැය 5 කට අධික

කාලයක් සමාජ මාධ්‍ය පරිශීලනය කරයි. සෙසු 40%ක් පරිශීලනය කරන්නේ පැයකට අඩු කාලයකි (Kemp, 2020).

සයිබර් අවකාශය තුළ ඇති අසීමිත අවස්ථාවන් හා ප්‍රයෝජනයන් මෙන්ම අවදානම්කාරී හා අභියෝගාත්මක තත්ත්වයන් ද ඒ හා සමානව හෝ ඇතැම්විට ඉක්මවා යන පරිද්දෙන් ද පවතී. වසර 2016 දී, ජාත්‍යන්තර විදුලි සංදේශන සංගමය විසින් ස්වකීය සාමාජික රටවල් 193 ක් සඳහා පිළියෙල කළ ගෝලීය සයිබර් ආරක්ෂණ දර්ශකයෙහි ශ්‍රේණිගත කිරීමට අනුව ශ්‍රී ලංකාවට හිමිවන්නේ 72 ස්ථානයයි (Telecommunications Regulatory Commission of Sri Lanka, 2018). වර්ෂ 2015 තුළ ලොව පුරා සයිබර් අවකාශය තුළ ආරක්ෂාවට තර්ජනයක් වූ සිද්ධීන් මිලියන 59.06ක් වාර්තා වී ඇත. ශ්‍රී ලංකාව තුළ 2017 වර්ෂය තුළ වාර්තා වුණු එවැනි සිදුවීම් ගණන 3,907 කි. ඉන් 3685 (94.3%) සමාජ මාධ්‍ය ආශ්‍රිතව සිදු වී ඇත. 2010 සිට 2017 දක්වා කාල පරාසය තුළ අප රටේ සයිබර් ආරක්ෂාවට තර්ජනය වූ සිදුවීම්වලින් 4500%ක ඉහළ යාමක් වාර්තා වී ඇත (Telecommunications Regulatory Commission of Sri Lanka, 2020).

සමාජ මාධ්‍ය භාවිතය වැඩිවීමත් සමග සමාජ මාධ්‍ය හරහා අපරාධ ගොදුරුවලට යොමු වීමේ ප්‍රවණතාව වැඩි වී ඇත. එසේ බහුලව සිදුවන අපරාධ ලෙස අනවසරයෙන් ඇතුළු වීම, මාර්ගගත තර්ජන, ලුහුබැඳීම හා වාණිජ පැතිකඩයන් නිර්මාණය කිරීම, ව්‍යාජ සබැඳි මිත්‍රත්වය යන අපරාධ හඳුනාගත හැකි වී ඇත. මේ අනුව සමාජ මාධ්‍ය පරිශීලකයන් අපරාධ ගොදුරු බවට පත්වීමට බලපාන සාධක අධ්‍යයනය කිරීම ඉතා වැදගත් වේ. (ශ්‍රී ලංකා හදිසි ප්‍රතිචාර සංසදය, 2020).

## 2. සාහිත්‍ය විමර්ශනය

Gatti සහ Napoli (2019) සිදුකර ඇති අධ්‍යයනයේ දී දෙමව්පියන්ගේ සංජානනය සහ දරුවන්ගේ සමාජ මාධ්‍ය භාවිතය ඔවුන්ගේ පවුල් සබඳතාවලට හානියක් නොවන පරිදි කළමනාකරණය කිරීම කළ හැකි බව පෙනී යයි. ඒ අනුව ඔවුන්ගේ පවුල් සබඳතා කෙරෙහි සමාජ මාධ්‍යවල බලපෑම් පිළිබඳව දෙමව්පියන් ධනාත්මක සංජානනයක් වර්ධනය කිරීමේ අවශ්‍යතාව මතුවේ. ඒ සඳහා සමාජ මාධ්‍ය ක්‍රියාකාරීව භාවිත කරන ආකාරය පිළිබඳව දෙමව්පියන්ගේ දැනුම ප්‍රවර්ධනය කිරීම කළ යුතු බව පෙන්වා දී ඇත.

Bocij (2020) විසින් සිදුකළ අධ්‍යයනයට ප්‍රතිචාර දැක්වූ පිරිසගෙන් පරිගණක සාක්ෂරතාව පිළිබඳ අධ්‍යයනය කිරීමේදී ආරම්භක මට්ටමේ, මධ්‍යස්ථ මට්ටමේ සහ විශේෂඥ හෝ වෘත්තිය දැනුම් ඇති ප්‍රතිශතය පිළිවෙළින් 34.13%ක් 43.71%ක් සහ 22.16%ක් වූ අතර මධ්‍යස්ථ මට්ටමේ පරිගණක සාක්ෂරතාව ඇති පුද්ගල ප්‍රතිශතය වැඩි බවක් මෙම අධ්‍යයනය තුළින් හඳුනාගත හැකිවිය.

Fansher සහ Randa (2018) සිදුකර ඇති පර්යේෂණයේ නියැදියට ඇතුළත් වූ සිසුන්ගෙන් 10 දෙනෙකුගෙන් එක් අයෙකු අන්තර්ජාලය හරහා යමෙකු සමග මූලික සම්බන්ධතා පැවැත්වීමෙන් පැය 24ක් ඇතුළත තමන් පිළිබඳ පුද්ගලික තොරතුරු

අනාවරණය කරන බවත් යෞවනයන් 20 දෙනෙකුගෙන් එක් අයෙකු පුද්ගලික හමුවීමට කෙනෙකු තෝරා ගැනීම පැය 24ක් වැනි කුඩා කාලයකදී තීරණය කරන බවත් ය. එසේ ම කාන්තාවන්ට සාපේක්ෂව වැඩි වශයෙන් පිරිමි පුද්ගලයින් තම පුද්ගලික ලිපිනය හා ජංගම දුරකථන අංකය සමාජ මාධ්‍ය හරහා හුවමාරු කරගන්නා බව හෙළි වී ඇත. මෙම පර්යේෂණයට ප්‍රතිචාර දැක්වූවන්ගෙන් 10%කට වඩා වැඩි ප්‍රමාණයක් සමාජ මාධ්‍ය මඟින් මුලින් මුණගැසුණු අපරාධකරුවෙකුගේ ප්‍රතිඵලයක් ලෙස සමාජ මාධ්‍ය හරහා ලුහුබැඳීමකට, ලිංගික හිරිහැරයකට, සයිබර් අපරාධයකට ගොදුරුවන බව අනාවරණය කරගෙන ඇත. ඒ අනුව පුද්ගලයන් ඉතා ඉකිමනින් සබඳතාවන් ගොඩ නගා ගැනීමට තෝරා ගැනීම පිළිබඳ අවධානමක් පවතින බව නිගමනය කර ඇත.

සමාජ මාධ්‍ය වෙබ් අඩවිවල සයිබර් හිරිහැරවලින් ආරක්ෂා වීම පිළිබඳ අධ්‍යයනයක් සිදු කර ඇත. ඒ අනුව සමාජ මාධ්‍ය වෙබ් අඩවි තුළදී වින්දිතයෙකු නොවී සිය කටයුතු සිදු කර ගෙන යාමේ දී පුද්ගලයන් ලෙස සැලකිලිමත් විය යුතු කරුණු කිහිපයක් මෙම අධ්‍යයනයේ දී උපාධි අපේක්ෂිකාවන් සඳහන් කර ඇත. එනම් ආරක්ෂක පද්ධතිය වැඩි දියුණු කිරීම, වෙනස් මුරපද භාවිත කිරීම, මුරපද නිතර වෙනස් කිරීම, ශක්තිමත් අනන්‍යතාවක් තිබීම, තමන් ගැන ගෞරවයක් හා විශ්වාසයක් තිබීම ඒ අතරින් වැදගත් බවයි. තවදුරත් මෙම අධ්‍යයනය තුළින් සමාජ මාධ්‍ය පිළිබඳ ඔවුන්ගේ දැනුවත්භාවය ඉහළ මට්ටමක පැවතිය යුතු බව නිගමනය වී ඇත (Carter, 2013).

සමස්තයක් ලෙස ඉහත අධ්‍යයනයන් සඳහා අවධානය යොමු කිරීමේදී පැහැදිලි වන්නේ විදේශීය හා දේශීය වශයෙන් සමාජ මාධ්‍ය පිළිබඳවත්, ඒ ආශ්‍රිතව පරිශීලකයන්ට මුහුණ දීමට සිදු වන හිරිහැර පිළිබඳවත්, ඒ සඳහා බලපාන කරුණු පිළිබඳවත්, අධ්‍යයන රැසක් සිදුකර ඇති බවත් ය. නමුත් බොහෝ සමීක්ෂකයන් ෆේස්බුක් සමාජ මාධ්‍ය දෙස වැඩි අවධානයක් යොමු කර ඇති අතර එහිදී පරිශීලකයන්ට සිදුවන හිරිහැර පිළිබඳව පමණක් කරුණු අනාවරණය කර ඇත. සමාජ මාධ්‍ය පරිශීලනයේදී ස්ත්‍රීන්ට සිදුවන බලපෑම් පිළිබඳව වැඩි අවධානයක් යොමුකර ඇති බවත් බොහෝ අධ්‍යනයන් සඳහා ද්විතීයික දත්ත පදනම් කර ඇති බව පැහැදිලි වේ. එසේම ශ්‍රී ලංකාව තුළ ද සයිබර් අපරාධ පිළිබඳ අධ්‍යයන සිදුකර ඇති නමුත් සමාජ මාධ්‍ය ආශ්‍රිත අපරාධ පිළිබඳව සිදු කර ඇති අධ්‍යයනයන් පවතින්නේ අඩු මට්ටමෙනි. මෙම කරුණු සලකා බැලීමේදී ඒ පිළිබඳව අධ්‍යයනය කිරීම වැදගත් වන හෙයින් සමාජ මාධ්‍ය පරිශීලකයන් අපරාධ ගොදුරු බවට පත්වීමට බලපාන සාධක අධ්‍යයනය යන මාතෘකාව යටතේ සිදුකරන අධ්‍යයනය කාලීන මෙන්ම සමාජීය වශයෙන් ද ඉතා වැදගත් ලෙස පෙන්වා දිය හැකිය.

ඒ අනුව සාහිත්‍යය විමර්ශනයේ දී හඳුනාගත් අධ්‍යයන හිඩැස අනුව අධ්‍යයනයේ අරමුණ වන්නේ සමාජ මාධ්‍ය හරහා අපරාධ වින්දිතයන් බවට පත්වීමට බලපාන හේතු අධ්‍යයනය කිරීම් වේ.

## 3. අධ්‍යයන ක්‍රමවේදය

වර්තමානයේ වනවිට ශ්‍රී ලංකාව තුළ සමාජ මාධ්‍ය අපරාධ සම්බන්ධ සිදුවීම් බහුලව වශයෙන් වාර්තා වන අතර බස්නාහිර පළාත තුළින් වැඩිම පැමිණිලි ප්‍රමාණයක් වූ 368ක් 2019 වර්ෂයේ දී වාර්තා වී ඇත. එය සැලකිල්ලට ගනිමින් මෙම අධ්‍යයනය සඳහා අධ්‍යයන ප්‍රදේශය වශයෙන් බස්නාහිර පළාත තෝරා ගනු ලැබීය. ඒ අනුව යමානි ක්‍රමවේදය යටතේ නියැදි ඒකක 100ක් තෝරාගෙන ඇත. එනම් ස්තෘත සසම්භාවී නියදුම් ක්‍රමය යටතේ පවතින සමානුපාතික විභේදනය යටතේ කොළඹ දිස්ත්‍රික්කයෙන් නියැදි ඒකක 40ක්, ගම්පහ දිස්ත්‍රික්කයේ නියැදි ඒකක 39ක් සහ කළුතර දිස්ත්‍රික්කයේ නියැදි ඒකක 21ක් වශයෙන් තෝරාගෙන ඇත.

සමාජ මාධ්‍ය පරිශීලකයන් අපරාධ ගොදුරු බවට පත්වීමට බලපාන සාධක අධ්‍යයනය සඳහා දත්ත රැස් කිරීමේ දී ප්‍රාථමික දත්ත සහ ද්විතීයික දත්ත වෙන වෙනම අධ්‍යයනය කිරීම වැදගත් වේ. මෙම අධ්‍යයනයේ දී දත්ත රැස් කිරීම සඳහා මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ ගූගල් පෝරමයක් හරහා ප්‍රශ්නාවලියක් ලබාදෙමින් දත්ත එක්රැස් කිරීම සිදු කරයි.

## 4. දත්ත විශ්ලේෂණය

මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ වන්නේ සමාජ මාධ්‍ය පරිශීලකයින් අපරාධ ගොදුරු බවට පත්වීමට බලපාන සාධක අධ්‍යයනය කිරීමයි. සාධක විශ්ලේෂණ ශිල්ප ක්‍රමය යොදා ගනිමින් ලබාගන්නා ප්‍රතිඵලවල අධ්‍යයනයෙන් ඉහත අරමුණු සාක්ෂාත් කරගත් ආකාරය මෙහි අන්තර්ගත වේ. විචලතා ආකෘතියක් විස්තර කළ හැකි වඩාත් හොඳම රේඛීය සම්බන්ධතා කාණ්ඩය තෝරා ගැනීම සඳහා Principal Component Factoring (PCF) යන සාධක නිස්සාරණ ක්‍රමවේදයන් (Factoring Extraction) යටතේ Varimax යන සාධක කැරකැවීමේ ක්‍රමය (Rotating Factors) අනුව අපරාධ ගොදුරු බවට පත් වූ සමාජ මාධ්‍ය පරිශීලකයින් 100 දෙනෙකුගෙන් යුත් නියැදියක් අධ්‍යයනය කර ඔවුන් අපරාධ ගොදුරු බවට පත්වීමට බලපාන හේතු සාධක 15ක් පිළිබඳව රැස් කළ දත්ත සම්බන්ධව සිදුකරන ලද දත්ත විශ්ලේෂණය පහත පරිදි වේ.

### *4.1 දත්තයන් ප්‍රවර්ග විචල්‍යය සඳහා වනවිට Cronbach's Alpha (CAS) අගය පරීක්ෂා කිරීම*

විවිධ වූ පරිණාමයන්ගෙන් එක් රැස් කරගන්නා දත්තවල සමස්ත ඒකීය බව නැතහොත් සංගත බව පරික්ෂා කිරීම සඳහා විශ්වාසනීයත්වය පරීක්ෂා කරයි. එමගින් දත්තවල පවතින අභ්‍යන්තර සංගත බව පිළිබඳ අදහසක් ලබාදෙයි. මෙම සංගත බව පැවතීම තුළින් අදහස් වන්නේ මෙම දත්ත හා සමාන වෙනත් තත්ත්වයක දී වුවද සමාන ප්‍රතිඵල ලබා දීමේ හැකියාවක් ඒ සඳහා පවතින බවයි. ඒ අනුව මෙම අගය අවම වශයෙන් 0.8ක් වත් විය යුතු බව දැක්විය හැකි අතර පොදු නීතිය වන්නේ සාධක විශ්ලේෂණයේ දී මෙම අගය $CAS \geq 0.7$ විය යුතු බවයි.

වගු අංක 1ට අනුව Cronbach's Alpha අගය 0.8ට වඩා වැඩි බැවින් එනම් 0.95ක අගයක් ගන්නා බැවින් සාධක විශ්ලේෂණය සඳහා යොදාගනු ලැබූ විචල්‍යය සමූහය විශ්වාසනීය මට්ටමක පවතින බව පැහැදිලි වේ.

වගු අංක 1: Cronbach's Alpha අගය පරික්ෂා කිරීම

| Cronbach's Alpha | N of Items |
|---|---|
| 0.947 | 15 |

*මූලාශ්‍රය : නියැදි සමීක්ෂණය, 2022*

### *4.2* KMO සහ Bartlett's අගය පරික්ෂා කිරීම

සාධක විශ්ලේෂණයේදී KMO පරීක්ෂාව සහ Bartlett's පරීක්ෂාව පිළිබඳ අවධානය යොමු කිරීමේ දී මෙමගින් සාධක විශ්ලේෂණය සඳහා යොදා ගන්නා දත්තයන්හි වලංගුභාවය පරික්ෂා කරයි. එහිදී KMO අගය මඟින් නියැදියේ ප්‍රමාණවත් බවත් Bartlett's පරීක්ෂාව මඟින් නියැදියේ Sphericity පරික්ෂා කරනු ලබයි. KMO අගය 0.5ට වඩා විශාල විය යුතු අතර Bartlett's අගයෙහි P අගය 0.05ට වඩා අඩු අගයක් ගත යුතුය. මෙම අධ්‍යනයට අනුව KMO අගය 0.842 වන අතර P අගය 0.05ට අඩු බැවින් මෙම සාධක විශ්ලේෂණය යෝග්‍ය පරීක්ෂාවක් වේ.

වගු අංක 2: KMO සහ Bartlett's අගය පරික්ෂා කිරීම

| | | |
|---|---|---|
| Kaiser-Meyer-Olkin Measure of Sampling Adequacy. | | 0.842 |
| Bartlett's Test of Sphericity | Approx. Chi-Square | 1328.165 |
| | df | 105 |
| | Sig. | 0.000 |

*මූලාශ්‍රය: නියැදි සමීක්ෂණය, 2022*

Principal Component Factoring සහ Principal Axis Factoring යන සාධක නිස්සාරණ ක්‍රම දෙකෙහිදී ම සහසම්බන්ධතා න්‍යාසය සමාන වේ. එමෙන්ම මෙහිදී සහසම්බන්ධතා න්‍යාසය මඟින් විචල්‍යයන්ගේ සංගුණකය හා වෙසෙසියා මට්ටම දක්වනු ලබයි. ඒ අනුව වගුවේ ඉහළ කොටසින් පියර්සන්ගේ සහසම්බන්ධතා අගයන් දැක්වෙන අතර පහළ කොටසින් එහි වෙසෙසියා මට්ටම දැක්වේ. මෙම අධ්‍යයනයට අනුව සියලුම විචල්‍යයන් අතර ඉතා හොඳ සහසම්බන්ධතා මට්ටමක් සහ සෑම විචල්‍යයන් දෙකක් අතරම සහසම්බන්ධතාව $\propto = 0.05$ වෙසෙසියා මට්ටමෙන් වෙසෙසි වන බව නිගමනය කළ හැකිය.

වගු අංක 3: PCF සාධක නිස්සාරණ ක්‍රමය යටතේ Varimax, Quartimax සහ Equamaxm යන සාධක කැරකැවීමේ ක්‍රම අනුව සංරචක නිර්මාණය කිරීම

| විචල්‍යය | Varimax | Quartimax | Equamaxm |
|---|---|---|---|
| | පරිශීලක ප්‍රජාවටම පෙනෙන ලෙස සමාජ මාධ්‍ය ජාලාවන්වලට | පරිශීලක ප්‍රජාවටම පෙනෙන ලෙස සමාජ මාධ්‍ය ජාලාවන්වලට ඡායාරූප ඇතුළත් කිරීම. | පරිශීලක ප්‍රජාවටම පෙනෙන ලෙස සමාජ මාධ්‍ය ජාලාවන්වලට |

| | | | |
|---|---|---|---|
| F1 | ඡායාරූප ඇතුළත් කිරීම. | | ඡායාරූප ඇතුළත් කිරීම. |
| | පවුල් සංස්ථාවෙන් හුදෙකලා වීම. | පවුල් සංස්ථාවෙන් හුදෙකලා වීම. | පවුල් සංස්ථාවෙන් හුදෙකලා වීම. |
| | වැඩි කාලයක් ගත කිරීම. | ලින්ක් විවෘත කිරීම | වැඩි කාලයක් ගත කිරීම. |
| | පෞද්ගලික අමනාපකම්. | පරිගණක සාක්ෂරතාවයක් නොපැවතීම. | පෞද්ගලික අමනාපකම්. |
| | මිතුරන් විශාල පිරිසක් ඇසුරු කිරීම. | පිවිසීමට යොදා ගන්නා උපාංගයෙහි ගිණුමේ මුරපදය සඳහන් කර තිබීම. | මිතුරන් විශාල පිරිසක් ඇසුරු කිරීම. |
| | අනවශ්‍ය ප්‍රමාණවලින් ඡායාරූප සහ වීඩියෝ සමාජ මාධ්‍ය ගත කිරීම. | වැඩි කාලයක් ගත කිරීම. | අනවශ්‍ය ප්‍රමාණවලින් ඡායාරූප සහ වීඩියෝ සමාජ මාධ්‍ය ගත කිරීම. |
| | නිවැරදිව අනන්‍යතාවය නොදැක්වී. | අනවශ්‍ය ප්‍රමාණවලින් ඡායාරූප සහ වීඩියෝ සමාජ මාධ්‍ය ගත කිරීම. | නිවැරදිව අනන්‍යතාවය නොදැක්වී. |
| | ව්‍යාපාරික කටයුතුවල නිරත වීම. | මිතුරන් විශාල පිරිසක් ඇසුරු කිරීම. | ව්‍යාපාරික කටයුතුවල නිරත වීම. |
| | | පෞද්ගලික අමනාපකම්. | |
| | | නිවැරදිව අනන්‍යතාවය නොදැක්වීම. | |
| | | ඩිජිටල් සාක්ෂරතාවක් නොපැවතීම. | |
| | | ව්‍යාපාරික කටයුතුවල නිරත වීම. | |
| F2 | ලින්ක් විවෘත කිරීම. | දැනුවත්භාවයක් නොපැවතීම. | ලින්ක් විවෘත කිරීම. |
| | සමාජ ජාලාවල ප්‍රචාරය කරන දැන්වීම්වලට ප්‍රතිචාර දැක්වීම. | සමාජ ජාලාවල ප්‍රචාරය කරන දැන්වීම්වලට ප්‍රතිචාර දැක්වීම. | සමාජ ජාලාවල ප්‍රචාරය කරන දැන්වීම්වලට ප්‍රතිචාර දැක්වීම. |
| | දැනුවත්භාවයක් නොපැවතීම. | | |
| | පරිගණක සාක්ෂරතාවයක් නොපැවතීම. | | දැනුවත්භාවයක් නොපැවතීම. |
| | ඩිජිටල් සාක්ෂරතාවක් නොපැවතීම. | | පරිගණක සාක්ෂරතාවයක් නොපැවතීම. |
| F3 | ශක්තිමත් මුරපදයක් භාවිත නොකිරීම. | | ශක්තිමත් මුරපදයක් භාවිත නොකිරීම. |
| | උපාංගයෙහි ගිණුමේ මුරපදය සඳහන් කර තිබීම. | ශක්තිමත් මුරපදයක් භාවිත නොකිරීම. | උපාංගයෙහි ගිණුමේ මුරපදය සඳහන් කර තිබීම. |

| | | | |
|---|---|---|---|
| | | | අනන්‍යතාවය නොදැක්වීම. |
| | | | ඩිජිටල් සාක්ෂරතාවක් නොපැවතීම. |

*මූලාශ්‍රය : නියැදි සමීක්ෂණය, 2022*

වගු අංක 4: PAF සාධක නිස්සාරණ ක්‍රමය යටතේ Varimax, Quartimax සහ Equamaxm යන සාධක කැරකැවීමේ ක්‍රම අනුව සංරචක නිර්මාණය කිරීම

| විචල්‍යය | Varimax | Quartimax | Equamaxm |
|---|---|---|---|
| F1 | පරිශීලක ප්‍රජාවටම පෙනෙන ලෙස සමාජ මාධ්‍ය ජාලාවන්වලට ඡායාරූප ඇතුළත් කිරීම. | පරිශීලක ප්‍රජාවටම පෙනෙන ලෙස සමාජ මාධ්‍ය ජාලාවන්වලට ඡායාරූප ඇතුළත් කිරීම. | පරිශීලක ප්‍රජාවටම පෙනෙන ලෙස සමාජ මාධ්‍ය ජාලාවන්වලට ඡායාරූප ඇතුළත් කිරීම. |
| | පවුල් සංස්ථාවෙන් හුදෙකලා වීම. | පවුල් සංස්ථාවෙන් හුදෙකලා වීම. | පවුල් සංස්ථාවෙන් හුදෙකලා වීම. |
| | වැඩි කාලයක් ගත කිරීම. | ලින්ක් විවෘත කිරීම | වැඩි කාලයක් ගත කිරීම. |
| | පෞද්ගලික අමනාපකම්. | පරිගණක සාක්ෂරතාවයක් නොපැවතීම. | පෞද්ගලික අමනාපකම්. |
| | මිතුරන් විශාල පිරිසක් ඇසුරු කිරීම. | පිවිසීමට යොදා ගන්නා උපාංගයෙහි ගිණුමේ මුරපදය සඳහන් කර තිබීම. | මිතුරන් විශාල පිරිසක් ඇසුරු කිරීම. |
| | අනවශ්‍ය ප්‍රමාණවලින් ඡායාරූප සහ වීඩියෝ සමාජ මාධ්‍ය ගත කිරීම. | වැඩි කාලයක් ගත කිරීම. | අනවශ්‍ය ප්‍රමාණවලින් ඡායාරූප සහ වීඩියෝ සමාජ මාධ්‍ය ගත කිරීම. |
| | නිවැරදිව අනන්‍යතාවය නොදැක්වී. | අනවශ්‍ය ප්‍රමාණවලින් ඡායාරූප සහ වීඩියෝ සමාජ මාධ්‍ය ගත කිරීම. | නිවැරදිව අනන්‍යතාවය නොදැක්වී. |
| | ව්‍යාපාරික කටයුතුවල නිරත වීම. | මිතුරන් විශාල පිරිසක් ඇසුරු කිරීම. | ව්‍යාපාරික කටයුතුවල නිරත වීම. |
| | | පෞද්ගලික අමනාපකම්. | |
| | | නිවැරදිව අනන්‍යතාවය නොදැක්වීම. | |
| | | ඩිජිටල් සාක්ෂරතාවක් නොපැවතීම. | |
| | | ව්‍යාපාරික කටයුතුවල නිරත වීම. | |
| | | දැනුවත්භාවයක් නොපැවතීම. | |
| | | සමාජ ජාලාවල ප්‍රචාරය කරන දැන්වීමවලට ප්‍රතිචාර දැක්වීම. | |


<table>
<tr><td rowspan="5">F2</td><td>ලින්ක් විවෘත කිරීම.</td><td rowspan="5"></td><td>ලින්ක් විවෘත කිරීම.</td></tr>
<tr><td>සමාජ ජාලාවල ප්‍රචාරය කරන දැන්වීම්වලට ප්‍රතිචාර දැක්වීම.</td><td>සමාජ ජාලාවල ප්‍රචාරය කරන දැන්වීම්වලට ප්‍රතිචාර දැක්වීම.</td></tr>
<tr><td>දැනුවත්භාවයක් නොපැවතීම.</td><td>දැනුවත්භාවයක් නොපැවතීම.</td></tr>
<tr><td>පරිගණක සාක්ෂරතාවයක් නොපැවතීම.</td><td rowspan="2">පරිගණක සාක්ෂරතාවයක් නොපැවතීම.</td></tr>
<tr><td>ඩිජිටල් සාක්ෂරතාවක් නොපැවතීම.</td></tr>
<tr><td rowspan="4">F3</td><td>ශක්තිමත් මුරපදයක් භාවිත නොකිරීම.</td><td rowspan="4">ශක්තිමත් මුරපදයක් භාවිත නොකිරීම.</td><td>ශක්තිමත් මුරපදයක් භාවිත නොකිරීම.</td></tr>
<tr><td rowspan="3">උපාංගයෙහි ගිණුමේ මුරපදය සඳහන් කර තිබීම.</td><td>උපාංගයෙහි ගිණුමේ මුරපදය සඳහන් කර තිබීම.</td></tr>
<tr><td>අනන්‍යතාවය නොදැක්වීම.</td></tr>
<tr><td>ඩිජිටල් සාක්ෂරතාවක් නොපැවතීම.</td></tr>
</table>

*මූලාශ්‍රය: නියැදි සමීක්ෂණය, 2022*

වගු අංක 3 සහ වගු අංක 4 අනුව PCF Varimax සහ PAF Varimax සාධක කැරකැවීමේ ක්‍රමයේදී පළමු සාධකය, දෙවන සාධකය, සහ තුන්වන සාධක සඳහා ලැබී ඇත්තේ සමාන ප්‍රතිඵලයකි. එසේම PAF Quartimax සාධක කැරකැවීමේ ක්‍රමයේදී දෙවන සාධක යටතේ විචල්‍යයන් 2ක් හඳුනාගත හැකි අතර PAF Quartimax සාධක කැරකැවීමේ ක්‍රමයේදී දෙවන සාධකය යටතේ කිසිදු විචල්‍යයක් හඳුනාගත නොහැකි වී ඇත. නමුත් PCF සහ PAF Quartimax සාධක කැරකැවීමේ ක්‍රමයේදී තුන් වන සාධකය යටතේ සමාන ප්‍රතිඵල ලැබී ඇත. එසේම PCF සහ PAF Equamax සාධක කැරකැවීමේ ක්‍රමයේදී ද පළමු සාධකය, දෙවන සාධකය සහ තුන්වන සාධකය අතර වෙනස්වීම් පවතින බව හඳුනාගත හැකිවේ.

Costello සහ Osborne (2005) සඳහන් කර ඇති ආකාරයට සාධක විශ්ලේෂණයක් සඳහා වඩා පිළිගන්නා සහ ප්‍රචලිත ක්‍රමවේදය වන්නේ Principal Component Factoring (PCF) සාධක නිස්සාරණ ක්‍රමය සහ Varimax සාධක කැරකීමරකීමේ ක්‍රමයයි. Nalaka සහ Diunugala (2020) විසින් සමාජ මාධ්‍ය ආශ්‍රිත අපරාධ වින්දිතකරණය හා සම්බන්ධ සාධක අධ්‍යයනය පිළිබඳ සිදුකර ඇති පර්යේෂණයේ සාධක සෙවීම සඳහා Principal Component Factoring යටතේ Varimax ක්‍රමය භාවිතා කර ඇති අතර එම අධ්‍යයනය හා සමාන අධ්‍යයනයක් වන සමාජ මාධ්‍ය අපරාධ ගොදුරු බවට පත්වීමට බලපාන සාධක අධ්‍යයනය සඳහා ද එම PCF - Varimax ක්‍රමය යටතේ සාධක කැරකීම මඟින් සාධක විශ්ලේෂණය වඩාත් සුදුසු වේ. ඒ අනුව මෙම අධ්‍යයනයේ දී PCF - Varimax ක්‍රමය ඔස්සේ සාධක විශ්ලේෂණය සිදු කර ඇති ආකාරය සහ ප්‍රතිඵල අර්ථ දැක්වීම පහත පරිදි වේ.

ප්‍රස්තාර සටහන 1: අයිගන් අගයන් සහ සාධක අගයන් PCF - Varimax




*මූලාශ්‍රය: නියැදි සමීක්ෂණය, 2022*

ප්‍රස්තාර සටහන 1 Principal Component Factoring සාධක නිස්සාරණ ක්‍රමය අනුව Varimax කරකැවීමේ ක්‍රමයේ දී ලැබී ඇති Scree Plot සටහනට අනුව ප්‍රධාන සංරචක 3ක් පවතින බව පෙන්නුම් කරයි. පළමු සාධකයේ අගය ඉහළ අගයක් ගන්නා අතර එය ක්‍රමයෙන් පහත වැටී දෙවන සාධකය සහ තුන්වන සාධක අගය 1ට ආසන්නයේ පවතී. අනෙකුත් අගයන් 1ට පහළ අගයක් ගන්නා බැවින් සමාජ මාධ්‍ය පරිශීලකයින් අපරාධ ගොදුරු බවට පත්වීමට බලපාන ප්‍රධාන සාධක 3ක් හඳුනාගත හැක.

වගු අංක 5: විචල්‍යයන්ගේ විචලතාවය PCF - Varimax

| Component | Initial Eigenvalues | | | Extraction Sums of Squared Loadings | | | Rotation Sums of Squared Loadings | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | Total | % of Variance | Cumulative % | Total | % of Variance | Cumulative % | Total | % of Variance | Cumulative % |
| 1 | 8.66 | 57.7 | 57.73 | 8.6 | 57.7 | 57.7 | 4.7 | 31.5 | 31.5 |
| 2 | 1.36 | 9.08 | 66.82 | 1.36 | 9.08 | 66.82 | 3.69 | 24.64 | 56.23 |
| 3 | 1.14 | 7.61 | 74.43 | 1.14 | 7.61 | 74.43 | 2.73 | 18.19 | 74.43 |
| 4 | .739 | 4.92 | 79.36 | | | | | | |
| 5 | .570 | 3.79 | 83.159 | | | | | | |
| 6 | .521 | 3.47 | 86.629 | | | | | | |
| 7 | .48 | 3.20 | 89.83 | | | | | | |
| 8 | .37 | 2.46 | 92.30 | | | | | | |
| 9 | .31 | 2.09 | 94.39 | | | | | | |
| 10 | .21 | 1.40 | 95.79 | | | | | | |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 11 | .17 | 1.18 | 96.98 | | | | | | |
| 12 | .168 | 1.12 | 98.10 | | | | | | |
| 13 | .14 | .969 | 99.07 | | | | | | |
| 14 | .09 | .620 | 99.69 | | | | | | |
| 15 | .04 | .306 | 100.0 | | | | | | |

*මූලාශ්‍රය : නියැදි සමීක්ෂණය, 2022*

සාධක කැරකවීමේ ක්‍රම (Rotating Factors) අතර වඩාත් බහුලව යොදාගන්නා ක්‍රමය වන්නේ මෙම Varimax ක්‍රමයයි. සාධක විශ්ලේෂණයක් සිදු කිරීමේ දී යොදා ගන්නා විවිධ සාධක නිස්සාරණ ක්‍රමය යටතේ සාධක ලබා ගැනීමෙන් පසු එය විග්‍රහ කිරීම එතරම් පහසු නැත. ඒ සඳහා Orthogonal Transformation මඟින් පවතින සාධක අර්ථවත් ලෙස කැරකිවිය (Rotation) යුතුය. මෙහිදී Principal Component Factoring සාධක නිස්සාරණ ක්‍රමය යටතේ Varimax සාධක කැරකවීමේ ක්‍රමය අනුව සිදුකළ සාධක විශ්ලේෂණය ඉහත පරිදි වේ.

වගු අංක 5 අනුව පෙනීයන්නේ අයිගන් අගය 1ට වඩා වැඩි සංරචක 3ක් පමණක් ඇති බවයි. අයිගන් අගය 1ට වැඩි වීම මත පදනම්ව එම සංරචක තුන ප්‍රධාන සාධක ලෙස ලබා ගන්නා අතර එමඟින් සලකා බලන විචල්‍යයන් 15හි විචලනයෙන් 74%ක් විස්තර වන බව දැක්විය හැකිය. එනම් මෙහි දී සලකා බලන විචල්‍යයන් 15හි විචලනයෙන් 31.5%ක් පළමු සංරචකය මඟින්, 24.6%ක් දෙවන සංරචකය මඟින සහ 18.2%ක් තුන්වන සංරචකය මඟින් ආදී වශයෙන් විස්තර වේ.

### *4.2 PCF - Varimax ක්‍රමය අනුව සංරචක නිර්මාණය කිරීම*

වගු අංක 6: PCF - Varimax ක්‍රමය අනුව සංරචක නිර්මාණය කිරීම

| | සංරචක | | |
|---|---|---|---|
| | 1 | 2 | 3 |
| ශක්තිමත් මුරපදයක් භාවිත නොකිරීම | 0.258 | 0.039 | **0.889** |
| සමාජ මාධ්‍ය වෙත පිවිසීමට යොදා ගන්නා උපාංගයෙහි ඔබගේ ගිණුමේ මුරපදය සඳහන් කර තිබීම | 0.339 | 0.287 | **0.763** |
| සමස්ත සමාජ මාධ්‍ය පරිශීලක ප්‍රජාවටම පෙනෙන ලෙස සමාජ මාධ්‍ය ජාලාවන්වලට ඡායාරූප ඇතුළත් කිරීම | **0.768** | 0.260 | 0.282 |
| සමාජ මාධ්‍ය හරහා පැමිණෙන ලින්ක් විවෘත කිරීම | 0.349 | **0.674** | 0.080 |
| තෑගි ලබා දෙනවා යැයි පවසන සමාජ ජාලාවල ප්‍රචාරය කරන දැන්වීමවලට ප්‍රතිචාර දැක්වීම | 0.306 | **0.839** | -0.004 |
| සමාජ මාධ්‍ය හරහා සිදුවන අපරාධ පිළිබඳ දැනුවත්භාවයක් නොපැවතීම | 0.182 | **0.825** | 0.245 |
| පරිගණක සාක්ෂරතාවයක් නොපැවතීම | 0.251 | **0.716** | 0.455 |

| | | | |
|---|---|---|---|
| සමාජ මාධ්‍ය භාවිතයත් සමග පවුල් සංස්ථාවෙන් හුදෙකලා වීම | **0.709** | 0.307 | 0.241 |
| සමාජ මාධ්‍ය හරහා වැඩි කාලයක් ගත කිරීම | **0.827** | 0.171 | 0.133 |
| පෞද්ගලික අමනාපකම් | **0.628** | 0.452 | 0.297 |
| මිතුරන් විශාල පිරිසක් ඇසුරු කිරීම | **0.834** | 0.179 | 0.233 |
| අනවශ්‍ය ප්‍රමාණවලින් ඡායාරූප සහ වීඩියෝ සමාජ මාධ්‍ය ගත කිරීම | **0.711** | 0.270 | 0.426 |
| සමාජ මාධ්‍ය හරහා නිවැරදිව අනන්‍යතාවය නොදැක්වීම | **0.516** | 0.475 | 0.471 |
| ඩිජිටල් සාක්ෂරතාවක් නොපැවතීම | 0.251 | **0.611** | 0.594 |
| සමාජ මාධ්‍ය හරහා ව්‍යාපාරික කටයුතුවල නිරත වීම | **0.739** | 0.403 | 0.168 |

මූලාශ්‍රයඃ නියැදි සමීක්ෂණය, *2022*

වගු අංක 6 හි Varimax සාධක කැරකීමේ ක්‍රමය අනුව ප්‍රධාන සංරචක තුනට අදාළ විචල්‍යයන්ගේ බෙදා වෙන් වූ ආකාරය පහත දැක්වේ. ඒ අනුව පළමු සංරචකයට විචල්‍යයන් 8ක් ද දෙවන සංරචකයට විචල්‍යයන් 5ක් ද තුන්වන සංරචකයට විචල්‍යයන් 2ක් වශයෙන් ද බෙදී ගොස් ඇත.

**5. නිගමන සහ යෝජනා**

PCF - Varimax ක්‍රමය අනුව සාධක විශ්ලේෂණය මගින් සමාජ මාධ්‍ය හරහා අපරාධ ගොදුරු බවට පත්වීමට බලපෑම් කරන ප්‍රධාන සාධක තුනක් යටතේ විචල්‍යයන් බෙදා දක්වා ඇත. එහිදී පහත සටහන අනුව සමාජ මාධ්‍ය පරිශීලකයන් අපරාධ ගොදුරු බවට පත්වීමට බලපාන සමස්ත සමාජ මාධ්‍ය පරිශීලක ප්‍රජාවටම පෙනෙන ලෙස සමාජ මාධ්‍ය ජාලාවන්වලට ඡායාරූප ඇතුළත් කිරීම, සමාජ මාධ්‍ය භාවිතයත් සමග පවුල් සංස්ථාවෙන් හුදෙකලා වීම, සමාජ මාධ්‍ය හරහා වැඩි කාලයක් ගත කිරීම, පෞද්ගලික අමනාපකම්, මිතුරන් විශාල පිරිසක් ඇසුරු කිරීම, අනවශ්‍ය ප්‍රමාණවලින් ඡායාරූප සහ වීඩියෝ සමාජ මාධ්‍ය ගත කිරීම, සමාජ මාධ්‍ය හරහා නිවැරදිව අනන්‍යතාවය නොදැක්වීම, සමාජ මාධ්‍ය හරහා ව්‍යාපාරික කටයුතුවල නිරත වීම යනාදිය පළමු සංරචකයේ සමග දැඩි ලෙස සම්බන්ධ වී ඇත. මෙම සාධක සමාජය සමග සම්බන්ධ සාධක වන බැවින් එය සමාජ බලපෑම ලෙස නම් කර තිබේ. ඊට අමතරව සමාජ මාධ්‍ය හරහා පැමිණෙන ලින්ක් විවෘත කිරීම, තෑගි ලබා දෙනවා යැයි පවසන සමාජ ජාලාවල ප්‍රචාරය කරන දැන්වීමවලට ප්‍රතිචාර දැක්වීම, සමාජ මාධ්‍ය හරහා සිදුවන අපරාධ පිළිබඳ දැනුවත්භාවයක් නොපැවතීම, පරිගණක සාක්ෂරතාවයක් නොපැවතීම, ඩිජිටල් සාක්ෂරතාවක් නොපැවතීම යන සාධක දෙවන සංරචකය සමග බැඳී පවතියි. මෙහිදී මෙම සාධක ආර්ථික තත්වයට බලපෑම් කරන බැවින් ආර්ථික බලපෑම ලෙස දෙවන සංරචකය නම් කර තිබේ. තවද ශක්තිමත් මුරපදයක් භාවිත නොකිරීම, සමාජ මාධ්‍ය වෙත පිවිසීමට යොදා ගන්නා උපාංගයෙහි ඔබගේ ගිණුමේ මුරපදය සඳහන් කර තිබීම යන සාධක තුන්වන සංරචකය සමග බැඳී පවතී. මෙහිදී මෙම සාධක පරිශීලක හැසිරීම් තත්වයට බලපෑම් කරන බැවින් පරිශීලක හැසිරීමේ බලපෑම ලෙස තුන්වන සංරචකය නම් කර තිබේ. එසේම අධ්‍යයනයට අනුව යෝජනා කිහිපයක් හඳුනාගත හැකිය. එනම්, පරිශීලකයින්

තම සමාජ මාධ්‍ය ගිණුම තුළ අසාමාන්‍ය ක්‍රියාකාරකම් පිළිබඳ ඇඟවීම් සක්‍රීය කිරීම කළ යුතුය, සමාජ මාධ්‍ය ගිණුම් තුළට තමන් නොදන්නා පුද්ගලයින් එකතු කර ගැනීමෙන් වැළකිය යුතු අතරම යමෙකු එකතු කර ගැනීමට පෙර ඔහුගේ මිතුරන් ලැයිස්තුවෙහි සිටින පුද්ගලයින් සහ ඔහුගේ පෙර සමාජ මාධ්‍ය තුළ ක්‍රියාකාරකම් පිළිබඳ පරීක්ෂා කර බැලිය යුතු බව යෝජනා කරමි, සමාජ මාධ්‍යයන්හි ලබා දී ඇති ස්වයංක්‍රීයව පිවිසුම් විශේෂාංගය අක්‍රීය කිරීම කළ යුතුය. එමෙන්ම සිය සමාජ මාධ්‍ය පිවිසුම් තොරතුරු විස්තර මතක තබා ගැනීමට දුරකථනයෙහි පවතින වෙබ් බවුසර්වලට ඉඩ ලබා නොදීම ද කළ යුතුය, කිසිදු විටක සමාජ මාධ්‍ය හරහා ප්‍රචාරය කරන දැන්වීම්වලට සිය පෞද්ගලික තොරතුරු මෙන්ම බැංකු කාඩ්වල තොරතුරු ලබා නොදීම කළ යුතුය, සමාජ මාධ්‍ය හරහා පැමිණෙන ලින්ක් විවෘත කිරීමෙන් වැළැකී සිටිය යුතුය යන්න ය.

**ආශ්‍රිත ග්‍රන්ථ**


ඉරංග, එස්. (2016), සමාජ මාධ්‍ය සංස්කෘතිය, කොළඹ 10, සී/ස ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

Bocij, P. (2020). *View of Victims of cyberstalking: An exploratory study of harassment perpetrated via the Internet | First Monday*. Peer-Reviewed Journal on the Internet. https://firstmonday.org/ojs/index.php/fm/article/view/1086/1006

Carter, M. A. (2013). Protecting Oneself from Cyber Bullying on Social Media Sites – a Study of Undergraduate Students. *Explore Scientific, Technical, and Medical Research on ScienceDirect*, *3*, 1235–1229. https://doi.org/10.1016/j.sbspro.2013.10.020

Costello, A. B., & Osbome, J. (2005). Best practices in exploratory factor analysis: four recommendations for getting the most from your analysis. *Practical Assessment, Research & Evaluatio*, *10*. https://doi.org/10.7275/jyj1-4868

Dewing, M. (2012). *Determinants of Youth Engagement with Health Information on Social Med ia Platforms in United Arab Emirates*. Scientific Research Publishing Inc. Retrieved on 19th November, 2021, from https://lop.parl.ca/Content/LOP/ResearchPublications/2010-03-e.pdf

Fansher, A., & Randa, R. (2019). Risky Social Media Behaviors and Potentional for Victimization: A Descriptive Look at Collage Students

Victimized. *Online Ahead of Prin*, *6*(2). Retrieved on 19th November, 2021, from https://www.liebertpub.com/doi/abs/10.1089/vio.2017 .0073

Gatti, F., & Napoli, I. (2019). Families and Social Media Use: The Role of Par ents' Perceptions about Social Media Impact on Family Systems in the Relationship bet ween Family Collective Efficacy and Open Communication. International Journal of En vironmental Research and Public Health, 16(24), 5006. Retrieved on 16th November, 2021, from https://doi.org /10.3390 /ijerph 16245006

Kemp, S. (2020). *Digital in 2019: Global Internet Use Accelerates*. We Are Social UK. Retrieved on 19th November, 2021, from https://wearesocial.com/uk/blog/2019/01/digital-in-2019-global-internet- use-accelerates/

Procentese, F., Gatti, F., & di Napoli, I. (2019). Families and Social Media Use: The Role of Parents' Perceptions about Social Media Impact on Family Systems in the Relationship between Family Collective Efficacy and Open Communication. *International Journal of Environmental Research and Public Health*, *16*(24), 5006. 19th November, 2021, from https://doi.org/10.3390/ijerph16245006

Suresh, N., & Hemantha, D. (2020). Factors Associating with Social Media related Crime Victi mization: Evidence from the Undergraduates at a Public University in Sri Lanka. *Interna tional Journal of Cyber Criminology; Thirunelveli*, *14*(1), 174–184. Retrieved on 10th December, 2021, from https://www.proquest.com/docview/ 24043 95436 ?pqorigsite=gscholar&from openview

Telecommunications Regulatory Commission of Sri Lanka Anuual Report. (2018). Retrieved on 11th December, 2022, from https://ww.trc.gov.lk/